සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>Buddhism I | 41 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබගේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* ප්‍රශ්න අංක **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර (1), (2), (3), (4), (5) යන වරණ අතුරෙන් තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. 'විජ්ජාචරණසම්පන්න' බුදුගුණයට ඇතුළත් චරණධර්ම පහළොවෙන් එකක් නම්,
(1) මහාකරුණාවයි. (2) පාපයට ඇති බියයි. (3) තාදි ගුණයයි.
(4) ඉවසීමයි. (5) පරතෝඝෝෂයයි.

2. බුද්ධඤාණ අතර 'චේතෝපරිය ඤාණය' යනු,
(1) ත්‍රිවිද්‍යාවන්ගෙන් එකකි.
(2) විදර්ශනා භාවනා මගින් උපදවාගන්නා ඤාණයකි.
(3) සත්ත්වයන්ගේ පෙර භව ඇති සැටියෙන් දක්නා ඤාණයයි.
(4) සිය සිතින් පරසිත් දක්නා ඤාණයයි.
(5) මිනිස් සිතේ පිරිහීම අවබෝධ කරගත හැකි ඤාණයයි.

3. බුදුරදුන්ගේ ඓතිහාසිකත්වය සනාථ කරන සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) ආටානාටිය සූත්‍රයයි. (2) චූළකම්මවිභංග සූත්‍රයයි. (3) පබ්බජ්ජා සූත්‍රයයි.
(4) අනත්තලක්ඛණ සූත්‍රයයි. (5) අච්ඡරියබ්භූතධම්ම සූත්‍රයයි.

4. බුදුරදුන්ගේ දේශනා විලාසයක් ලෙස හැඳින්විය **නොහැක්කේ**,
(1) සාකච්ඡා කිරීමයි. (2) අදාළ නොවන දේ පසෙකින් තැබීමයි.
(3) අනුපිළිවෙළ කථාවයි. (4) උපමා භාවිතයයි.
(5) විවාද කිරීමයි.

5. "වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යනු,
(1) අවමංගල්‍ය අවස්ථාවක බුදුරදුන් වදාළ බණ පදයකි.
(2) මංගල ධර්ම දේශනාවෙහි ඇතුළත් පාඨයකි.
(3) මහාපරිනිබ්බාන සූත්‍රයේදී භික්ෂූන්ට දෙන අවවාදයකි.
(4) මෙලොව දියුණුවට අදාළ උපදේශයකි.
(5) ධම්මපදයේ අප්පමාද වග්ගයෙහි සඳහන් වන්නකි.

6. සූත්‍ර පිටකය හැඳින්වීම සඳහා යෙදිය හැක්කේ,
(1) නිප්පරියායදෙසනා යන්නයි. (2) ආණාදෙසනා යන්නයි.
(3) පරමත්ථදෙසනා යන්නයි. (4) සම්මුතිදෙසනා යන්නයි.
(5) පඤ්ඤත්තිදෙසනා යන්නයි.

7. සූත්‍ර දේශනා එකොළහක් ඇතුළත් 'පාථික වර්ගය' හමුවන්නේ,
(1) දීඝනිකාය තුළ ය. (2) ධම්මසංගණිප්පකරණයේ ය.
(3) ඛුද්දකපාඨයේ ය. (4) අංගුත්තරනිකායේ ය.
(5) උදානපාළියේ ය.

[දෙවැනි පිටුව බලන්න

8. "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි" යන දහම් ගුණ පාඨයෙහි 'පච්චත්තං වෙදිතබ්බො' යනු,
   (1) තම සිතට සම්පකොට දැනගත යුතුය යන්නයි.
   (2) ප්‍රත්‍යක්ෂ කළ යුතුය යන්නයි.
   (3) වෙන් වෙන්ව හිඳ පසක් කරගත යුතුය යන්නයි.
   (4) සත්ත්වයා සසරින් මුදවා ගන්නේය යන්නයි.
   (5) ඇස් පනාපිට දැන දැකගත යුතුය යන්නයි.

9. බුද්දහමේ සුවිශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැක්කේ,
   (1) අනීශ්වරවාදී බව ය.
   (2) විඥ්ඥාණවාදී බව ය.
   (3) අසුභවාදී බව ය.
   (4) භෞතිකවාදී බව ය.
   (5) පුබ්බෙකතහේතුවාදී බව ය.

10. බුද්දහමේ දැක්වෙන 'උභයාර්ථ' අතරට ගැනෙන්නේ මොනවා ද?
   (1) සමථ හා විපස්සනා
   (2) ස්වාර්ථ හා පරාර්ථ
   (3) ශාස්වත හා අශාස්වත
   (4) වස්තුකාම හා ක්ලේශකාම
   (5) තුරිත හා අතුරිත

11. බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සමාජය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
   (1) ශ්‍රමණ සමාජයට අයත් වූවෝ වර්ණ ධර්ම නොපිළිගත්හ.
   (2) බුදුරදුන් දවස විවිධ ගුරුකුලවලට අයත් ශ්‍රමණයෝ විසූහ.
   (3) බොහෝ ශ්‍රමණයෝ දේව විශ්වාස ඇත්තෝ වූහ.
   (4) ස්ත්‍රීන්ට ද ඇතැම් ගුරුකුලවල ශ්‍රමණ ජීවිත ගත කළ හැකි විය.
   (5) විවිධ දුෂ්කර ව්‍රත අනුගමනය කිරීම ද ශ්‍රමණයන් අතර දක්නට ලැබිණි.

12. භික්ෂුණී සංඝ සමාජය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) භික්ෂු සමාජය ආරම්භ වී වසර 20 කට පසු භික්ෂුණී සමාජය ඇති විය.
   (2) භික්ෂුණී පැවිද්ද පිළිබඳව බුදුරදුන් ආරම්භයේ දී ම උනන්දු වී ඇත.
   (3) භික්ෂුණී උපසම්පදාවට භික්ෂූන් සහභාගි වීම බුදුරදුන් විසින් අනුදැන වදාරන ලදී.
   (4) භික්ෂුණී සමාජයට බුදුරදුන් විසින් තනතුරු ප්‍රදානය කර නැත.
   (5) අනුපසම්පන්න නවක භික්ෂු නමක විසින් භික්ෂුණියකට වැඳීම සුදුසු යැයි බුදුරදුන් විසින් පණවන ලදී.

13. උපසම්පදා භික්ෂූන් විසින් ආරක්ෂා කළ යුතු ශීලය හැඳින්වෙන්නේ,
   (1) දස ශීලය ලෙස ය.
   (2) ආජීව අෂ්ටමක ශීලය ලෙස ය.
   (3) උපෝසථ ශීලය ලෙස ය.
   (4) භික්ෂු ශීලය ලෙස ය.
   (5) අධිශීලය ලෙස ය.

14. සඟරුවනෙහි ඇති නවවැදෑරුම් ගුණ අතර 'සාමීචිපටිපන්න' යනු,
   (1) දුකින් මිදීමේ ධර්මානුධර්ම ප්‍රතිපදාවට යෝග්‍ය වූ ස්වභාවය යන්නයි.
   (2) දැහැමි කථාබහට යොමු වූ යන්නයි.
   (3) අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤා සහ උසස් පිළිවෙත් ඇති බවයි.
   (4) වැඳුම් පිදුම් ලැබීමට සුදුසු ය යන්නයි.
   (5) ලෝකයාගේ නිරුත්තර පින්කෙත යන්නයි.

15. විනය ශික්ෂා පැණවීමෙන් බුදුරදුන් අපේක්ෂා කළ කරුණු දහයක් පාරාජිකපාළියේ දැක්වේ. ඉන් එකක් නම්,
   (1) භික්ෂූන් ලාභ ප්‍රයෝජනවලට ගිජුවීම පාලනය කිරීමයි.
   (2) දුශ්ශීල මහණුන් සඟුනින් බැහැර කිරීමයි.
   (3) ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණයයි.
   (4) භික්ෂූන් තමාට අවනත පිරිසක් කරගැනීමයි.
   (5) ධර්මය හැදෑරීමට භික්ෂූන් උනන්දු කරවීමයි.

16. පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන 'ස්වධර්ම' යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) පුද්ගල ජීවිතය අවධි සතරකට බෙදීම ය.
   (2) සමස්ත සමාජය ම චතුර්වර්ණයන්ට වෙන් කිරීම ය.
   (3) බ්‍රහ්මන් විසින් ලෝකය හා සත්ත්වයා නිර්මාණය කිරීම ය.
   (4) යාගහෝම පැවැත්වීම ය.
   (5) ඒ ඒ වර්ණවලට අයත් කාර්යභාරයන් දැක්වීම ය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

17. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව මක්ඛලීගෝසාලගේ දර්ශනය තුළ දක්වා **නොමැති** කරුණක් නම්,
    (1) වීර්යය, බලය නියා කිසිවක් නැති බවයි.
    (2) අහේතු අප්‍රත්‍යව සත්ත්වයා පිරිසිදු හෝ අපිරිසිදු වන බවයි.
    (3) නියත ධර්මතා අනුව සියල්ල සිදුවන බවයි.
    (4) පදාර්ථ සතක සමවායෙන් සත්ත්වයා නිර්මිත බවයි.
    (5) සංසාර විමුක්තිය ඉබේ සිදුවන බවයි.

18. අග්ගඤ්ඤ සූත්‍රයේ සමාජ පරිණාමයට බලපෑ එක් සාධකයක් හඳුන්වා ඇත්තේ 'සන්නිධිකාර පරිභෝගය' ලෙසයි. එහි අර්ථය නම්,
    (1) ස්වාභාවික සම්පත් සම සමව බෙදාගෙන පරිහරණය කිරීමයි.
    (2) සම්පත් පොදුවේ පරිහරණය කිරීමයි.
    (3) සම්පත් රැස්කොට තබාගෙන පරිහරණය කිරීමයි.
    (4) අනුන් දේ තමන් සතු කොටගෙන පරිහරණය කිරීමයි.
    (5) ස්වාභාවික සම්පත් මුළුමනින් ම ක්ෂය වනතුරු පරිහරණය කිරීමයි.

19. බ්‍රාහ්මණ වර්ණධර්ම සංකල්පය විචාරයට ලක්කරන බුද්ධ දේශනාවක් ලෙස හැඳින්විය හැක්කේ,
    (1) බ්‍රහ්මජාල සූත්‍රයයි.
    (2) මධුපිණ්ඩික සූත්‍රයයි.
    (3) වාසෙට්ඨ සූත්‍රයයි.
    (4) සාමඤ්ඤඵල සූත්‍රයයි.
    (5) චූළසකුළුදායි සූත්‍රයයි.

20. දේවදහ සූත්‍රයේදී නිගණ්ඨනාතපුත්තගේ පුබ්බේකතහේතු වාදය බැහැර කරමින් බුදුදහම ඉදිරිපත් කරන කරුණක් වන්නේ,
    (1) සත්ත්වයා උසස් හෝ පහත් තත්වයට පත්ව ඇත්තේ කර්මානුරූපව බව ය.
    (2) සියල්ල පෙර කළ කර්මයෙන් ම සිදුවන්නේ නම්, කයට දුක් දීමට සිදු වී ඇත්තේ ද ඒ අනුව විය යුතු බව ය.
    (3) කර්මය කුසල, අකුසල යැයි දෙයාකාර වන බව ය.
    (4) කර්ම විපාක අනුව පුනර්භවය සිදුවන බව ය.
    (5) කර්ම සිද්ධාන්තය සංසාර පැවැත්මට අදාළ වන බව ය.

21. භික්ෂු-භික්ෂුණීන් හා උපාසක-උපාසිකාවන් ශාසනික කටයුතු විෂයයෙහි දිරිමත් කරමින් බුදුරදුන් විසින් විවිධ තනතුරු ප්‍රදානය කරන ලද බව සඳහන් වන ප්‍රධාන මූලාශ්‍රය,
    (1) පාරාජිකපාළියයි.
    (2) ධම්මපදපාළියයි.
    (3) ජාතකපාළියයි.
    (4) ඒතදග්ගපාළියයි.
    (5) පාචිත්තියපාළියයි.

22. ගිහි ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් බුදුරදුන් ප්‍රධාන භික්ෂූන්ට විවිධ අනුග්‍රහයන් දක්වන ලද බව මූලාශ්‍රය සඳහන් කරයි. ඒ අනුව වේළුවනාරාමය පූජා කරන ලද්දේ,
    (1) අජාසත් රජතුමා විසිනි.
    (2) අනේපිඬු සිටුතුමා විසිනි.
    (3) විශාඛා උපාසිකාව විසිනි.
    (4) බිම්බිසාර රජතුමා විසිනි.
    (5) රජගහනුවර සිටුතුමා විසිනි.

23. ප්‍රථම ධර්ම සංගායනාව පවත්වා ධර්ම විනය ගුරු-ශිෂ්‍ය පරම්පරාවෙන් පවත්වාගෙන යාමට පැවරීමේ දී ඛුද්දක නිකාය පවරන ලද්දේ,
    (1) ආනන්ද මහතෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට ය.
    (2) අනුරුද්ධ මාහිමිපාණන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට ය.
    (3) උපනන්ද මාහිමිපාණන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට ය.
    (4) මහාකාශ්‍යප මාහිමිපාණන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ය.
    (5) පොදුවේ සියලු ම භික්ෂූන්ට ය.

24. දෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් වජ්ජිපුත්තක භික්ෂූන් මතු කළ දසවස්තුව විනය විරෝධී යැයි තීරණය කර ලද්දේ මුලින් ම පත් කළ කමිටුවක් මගිනි. මූලාශ්‍රය එය හඳුන්වා ඇත්තේ,
    (1) උක්ඛෙපනීය නමිනි.
    (2) අධිකරණ සමථ නමිනි.
    (3) ඤත්ති චතුත්ථ නමිනි.
    (4) විනයපුච්ඡා නමිනි.
    (5) උබ්බාහිකා නමිනි.

25. තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු සඳහන් කොට ඇති වාර්තාවල දක්නට **නොලැබෙන** ශාසනික ගැටලුවක් නම්,
(1) නිකායාන්තර භේදියාම වර්ධනය වී තිබීමයි.
(2) අන්‍ය සාමයිකයන් සසුනට ඇතුල් වීමයි.
(3) භික්ෂූන් පොහෝ පවුරුණු නොකිරීමයි.
(4) ධර්මය පිළිබඳ විවිධ මතිමතාන්තර තිබීමයි.
(5) අර්හත්වය පිළිබඳ දූර්මත බිහිවීමයි.

26. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ස්කන්ධ ධර්ම යනු අසංස්කෘත ධර්මයන් ය.
(2) ස්කන්ධ ධර්මයෝ නිත්‍ය පැවැත්මක් ඇත්තෝ ය.
(3) සත්ත්වයා ආත්ම ලක්ෂණ ඇති ධර්ම සමවායකි.
(4) පඤ්චස්කන්ධයෝ පටිච්චසමුප්පන්න වෙති.
(5) සත්ත්වයාගේ භෞතික ශරීරය පඤ්චස්කන්ධයකට බෙදා දක්වා ඇත.

27. ත්‍රිලක්ෂණ ධර්මය පැහැදිලි කෙරෙන බුද්ධ දේශනාවක් වන්නේ,
(1) බ්‍රහ්මජාල සූත්‍රයයි.
(2) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(3) අනත්තලක්ඛණ සූත්‍රයයි.
(4) බ්‍රාහ්මණධම්මික සූත්‍රයයි.
(5) කාලාම සූත්‍රයයි.

28. ධාතුවිභංග සූත්‍රාදිය අනුව අටළොස් ධාතු විභාගයෙහි එන චක්ඛුවිඤ්ඤාණ ධාතුව උපදින්නේ, මූලික ධාතු දෙකක් ප්‍රත්‍යයකොට ගෙන ය. එනම්,
(1) පඨවි ධාතුව හා ආපෝ ධාතුවයි.
(2) මනෝ ධාතුව හා ධම්ම ධාතුවයි.
(3) චක්ඛු ධාතුව හා රූප ධාතුවයි.
(4) ජිව්හා ධාතුව හා රස ධාතුවයි.
(5) කාය ධාතුව හා පොට්ඨබ්බ ධාතුවයි.

29. අෂ්ටලෝක ධර්මයෙහි අකම්පිත වීම පිළිබඳව ප්‍රකාශ නොවන ධර්ම පාඨය මින් කුමක් ද?
(1) "ඵුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති."
(2) "චතුබ්භි වාතෙහි අසම්පකම්පියො."
(3) "එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා."
(4) "එතෙ අනිච්චා මනුජෙසු ධම්මා, අසස්සතා විපරිණාමධම්මා."
(5) "න තෙ භවං අට්ඨමං ආදියන්ති."

30. මානව ක්‍රියාකාරකම් පරිසරයටත්, පාරිසරික ක්‍රියාකාරකම් මානවයාටත් බලපාන බව ප්‍රකාශ වන්නේ,
(1) වනරෝප සූත්‍රයේ ය.
(2) අධම්මික සූත්‍රයේ ය.
(3) කූටදන්ත සූත්‍රයේ ය.
(4) මහාසච්චක සූත්‍රයේ ය.
(5) අරියපරියේසන සූත්‍රයේ ය.

31. දුක්ඛාර්ය සත්‍යය සතර ආකාරයකින් විග්‍රහ කෙරේ. එහි 'සංඛතට්ඨ' යනු,
(1) විපරිණාමයෙන් උපදනා දුක ය.
(2) හේතුප්‍රත්‍යයෙන් හටගන්නා දුක ය.
(3) අනේකවිධ තැවීම් සහිත දුක ය.
(4) ජාති, ජරා මරණාදී ව්‍යවහාරික දුක ය.
(5) විවිධ පීඩා ඇති කරන දුක ය.

32. 'ලෞකික සම්මාදිට්ඨි' යන්නට ඇතුළත් වන දසවැදෑරුම් කරුණු අතුරෙන් එකක් නම්,
(1) පුණ්‍යකර්ම සැප ගෙනදේ යන්නයි.
(2) ශ්‍රද්ධාවෙන් නිවන්මග පෑදේ යන්නයි.
(3) භාවනාවෙන් සිත දියුණුවේ යන්නයි.
(4) ඕපපාතික සත්ත්වයෝ ඇත යන්නයි.
(5) පව්කම් කිරීමෙන් අපාගත වේ යන්නයි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

33. "ඉමස්මිං සති ඉදං හොති" යනාදී පටිච්චසමුප්පාද කෙටි සූත්‍රයේ අන්තර්ගත ප්‍රකාශයක් වන්නේ,
(1) "හේතුං පටිච්චසම්භූතං හෙතුභංගා නිරුජ්ඣති." යන්නයි.
(2) "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන්නයි.
(3) "ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" යන්නයි.
(4) "යො පටිච්චසමුප්පාදං පස්සති. සො ධම්මං පස්සති." යන්නයි.
(5) "යෙ ධම්මා හෙතුප්පභවා" යන්නයි.

34. බුද්ධකාලීන ඇතැම් මහණ බමුණෝ උච්ඡේදවාදී වූහ. ඉන් අදහස් වන්නේ ඔවුන්,
(1) නිත්‍යාත්මය පිළිගත් බවයි.
(2) භව තණ්හාවෙන් ක්‍රියා කළ බවයි.
(3) අත්තකිලමථානුයෝගය ප්‍රගුණ කළ බවයි.
(4) පරලොවක් නොපිළිගත් බවයි.
(5) කර්මය හා විපාකය පිළිගත් බවයි.

35. බුදුදහමට අනුව සමාජගත දූකට තුඩුදෙන එක් කරුණක් නම්,
(1) ධනෝපායනයෙහි ලා තරගකාරී නොවීම ය.
(2) මමායනයෙන් තොරවීම ය.
(3) පින්කම් නොකිරීම ය.
(4) රාජ්‍ය පාලකයන්ට එරෙහිවීම ය.
(5) සමාජය තුළ දිළිඳුකම පැතිර යාම ය.

36. මිනිසාගේ ස්වාමිත්වය, ශ්‍රේෂ්ඨත්වය හා ශක්‍යතාව අගය කරන ධර්ම මාර්ගයක් වන බුදුදහම් අනුව නිවැරදි වන්නේ,
(1) අධිභෞතික බලවේගවලට මිනිසා යටත් වේ යන්නයි.
(2) දෙවි දේවතාවුන් පිළිබඳ කරුණු පෙළදහමේ දක්නට නොලැබේ ය යන්නයි.
(3) සත්ත්වයාට කර්ම විපාක ඉක්මවිය නොහැකිය යන්නයි.
(4) නියත ධර්මතා මඟින් මිනිසා හසුරුවනු ලැබේ ය යන්නයි.
(5) තමාට පිහිට තමා ම ය යන්නයි.

37. දස වැදෑරුම් පුණ්‍ය ක්‍රියා වස්තු අතර 'අපචායන' යනු,
(1) පිදිය යුත්තන් පිදීම ය.
(2) අපචාරවලින් වැළකීම ය.
(3) වතාවත් කිරීම ය.
(4) කිසිවෙකුටත් එරෙහි නොවීම ය.
(5) පවින් වැළකී සිටීම ය.

38. කුසලාකුසල කර්ම පිළිබඳ බෞද්ධ නිර්ණායකයක් **නොවන** ධර්ම පාඨය වන්නේ,
(1) "මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා" යන්නයි.
(2) "චෙතනා'හං භික්ඛවෙ කම්මං වදාමි" යන්නයි.
(3) "යං කම්මං පරව්‍යාබාධාය සංවත්තති" යන්නයි.
(4) "යං කත්වා නානුතප්පති" යන්නයි.
(5) "නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො" යන්නයි.

39. දස ශීලය උපොසථ අෂ්ටාංග ශීලයට වඩා උසස් වන්නේ, එම ශීලයෙහි පිහිටන තැනැත්තා,
(1) විකාලභෝජනයෙන් වැළකීම නිසා ය.
(2) මල්, සුවඳ ආදිය භාවිත නොකිරීම නිසා ය.
(3) රන්, රිදී, මසු, කහවණු භාවිතයෙන් වැළකීම නිසා ය.
(4) උස් අසුන්, මහ අසුන් පරිහරණයෙන් තොරවීම නිසා ය.
(5) නච්චගීතවාදිතාදියෙන් වැළකීම නිසා ය.

40. බෞද්ධ පුනර්භව සංකල්පය හා නොබැඳෙන ඉගැන්වීමක් ලෙස සැලකිය හැක්කේ,
(1) කර්ම සංකල්පයයි.
(2) හේතුඵල ධර්මයයි.
(3) ආත්ම දෘෂ්ටියයි.
(4) සංසාර සංකල්පයයි.
(5) පරලොව පිළිබඳ ඉගැන්වීමයි.

[හයවැනි පිටු

41. ගිහි බෞද්ධයෙකු විසින් සිය ආර්ථික සුරක්ෂිතභාව ඇති කරගැනීම පිණිස ධනය අරභයා අනුගමනය කළ යුතු පිළිවෙත් සතරක් රාසිය සූත්‍රයේ දැක්වෙයි. ඉන් එකක් නම්,
(1) බඹරෙකු මලක රොන් ගන්නාක් මෙන් ධනය ඉපයීම වේ.
(2) අය වැය සමව පවත්වා ගැනීම වේ.
(3) නොකළ යුතු වෙළඳාම්වලින් බැහැර වීම වේ.
(4) උපයාගත් ධනය ආරක්ෂා කර ගැනීම වේ.
(5) ඉපයූ ධනයෙහි ගිජුකමින් නොඇලීම වේ.

42. දැහැමින් හා උත්සාහයෙන් උපයාගත් සම්පත් පරිහරණය කිරීමෙන් ලබන තෘප්තිය සැපයකැයි අනණ සූත්‍රයේ සඳහන් වේ. එම සැපය දක්වා ඇත්තේ,
(1) අත්ථි සැපය ලෙස ය.
(2) ගිහි සැපය ලෙස ය.
(3) ලෞකික සැපය ලෙස ය.
(4) භෝග සැපය ලෙස ය.
(5) අනවජ්ජ සැපය ලෙස ය.

43. දසරාජ ධර්මවල 'පරිච්චාග' යන්නෙන් කියවෙන්නේ, රජු,
(1) දානාදී පිංකම් කළ යුතු බවයි.
(2) මහජන සුභසාධනය කළ යුතු බවයි.
(3) ප්‍රජාව වෙනුවෙන් කාලය, ශ්‍රමය හා ධනය කැප කළ යුතු බවයි.
(4) මහණ බමුණන්ට සිව්පසය පරිත්‍යාග කළ යුතු බවයි.
(5) ජීවිතයේ සැදෑ සමයේ දී සියලු සම්පත් අත්හළ යුතු බවයි.

44. දස සක්විති වත් අනුව පාලකයකුගේ මූලික වගකීම්වලින් එකක් නම්,
(1) කාන්තාවන්ගේ ආරක්ෂාව සැලසීම ය.
(2) බාහිර ප්‍රජාව සමග නොගැටී සිටීම ය.
(3) අන්තගාමී නොවී පාලන කටයුතු කිරීම ය.
(4) නිතර රැස්වීම ය.
(5) බලසෙනඟට දැහැමි රැකවරණය සැලසීම ය.

45. සමකාලීන ශ්‍රමණ ඉගැන්වීම් ඉක්මවා බුදුදහම භාවනාවේ ප්‍රතිඵල වශයෙන් පෙන්වා දෙන්නේ,
(1) ඉද්ධිවිධ ඤාණය ලබා ගැනීමයි.
(2) රාගාදී කෙලෙස් තදංග වශයෙන් යටපත් කිරීමයි.
(3) චතුර්විධ ධ්‍යාන උපදවා ගැනීමයි.
(4) සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තිය උපදවා ගැනීමයි.
(5) චේතෝපරිය ඤාණය ලබා ගැනීමයි.

46. සමථ භාවනාව මගින් යටපත් කළ යුතු පඤ්ච නීවරණ ධර්මයන්හි 'ථීනමිද්ධ නීවරණය' යනු,
(1) චිත්ත චෛතසිකයන්ගේ මැලිකමයි.
(2) උඩඟුකම හා සැකයයි.
(3) වෛරය හා ක්‍රෝධයයි.
(4) අත්තුක්කංසනය හා පරවම්භනයයි.
(5) සිත්හි නොසන්සුන් බව හා පසුතැවිල්ලයි.

47. විදර්ශනා භාවනාවේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) පඤ්ච නීවරණ යටපත් වීම ය.
(2) පඤ්ච අභිඥා ඉපදවීම ය.
(3) ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන උපදවා ගැනීම ය.
(4) අෂ්ට සමාපත්ති ලබාගැනීම ය.
(5) සියලු කෙලෙස් නැතිවීම ය.

48. මහාසතිපට්ඨාන සූත්‍රය අනුව සතර සතිපට්ඨානයන් වැඩීම තුළින් ලැබෙන ආනිසංස අතුරෙන් එකක් නම්,
(1) මරණින් මතු සුගතියෙහි ඉපදීම ය.
(2) දෙවියන්ගේ රැකවරණය ලැබීම ය.
(3) දුක්දොම්නස් සමතික්‍රමණය කිරීම ය.
(4) පවිටු සිහින නොපෙනීම ය.
(5) අමනුෂ්‍ය භය දුරුවීම ය.

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

49. මේ ශරීරය කෙස්, ලොම්, නිය, දත් ආදි කොට ඇති අසාර වූ දෙතිස් කුණපයකින් යුක්ත යැයි මෙනෙහි කිරීම හැඳින්විය **නොහැක්කේ**,

(1) කායගතාසතිය ලෙස ය.
(2) කායානුපස්සනාව ලෙස ය.
(3) අසුභානුස්සතිය ලෙස ය.
(4) අසුභ භාවනාව ලෙස ය.
(5) ආනාපානසතිය ලෙස ය.

50. පඤ්ච නීවරණ ධර්ම මගින් සිත කිලිටි කරන අයුරු සංගාරව සූත්‍රයේ දී උපමා මගින් විස්තර කෙරේ. ඒ අනුව ව්‍යාපාද නීවරණය උපමාකොට ඇත්තේ,

(1) පාට කළ ජල භාජනයකට ය.
(2) දිය සෙවලින් වැසී ගිය දිය බඳුනකට ය.
(3) බුබුළු දමන තුරු රත් කළ දිය බඳුනකට ය.
(4) සුළඟින් සෙලවෙන, රැලි නැගෙන දිය බඳුනකට ය.
(5) මඩ සහිත බොර වූ වතුර භාජනයකට ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

2224

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

බුද්ධ ධර්මය II
பௌத்தம் II
Buddhism II

41 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) 'යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී' බුදුගුණය හඳුන්වන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරදුන් ඓතිහාසික මනුෂ්‍යයෙක් වූ බව පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iii) බුදුරදුන් තුළ පැවැති සුහදශීලී චරිත ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)
   (iv) ආර්ය පර්යේෂණය යනු කුමක්දැයි විමසන්න. (ලකුණු 08යි.)

2. (i) 'ඕපනයික' දහම් ගුණයෙහි අර්ථ දක්වන්න. (ලකුණු 02යි.)
   (ii) සතර මහාපදේස හඳුන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iii) කාලාම සූත්‍රාගත සිතීමේ හා විමසීමේ නිදහස විස්තර කරන්න. (ලකුණු 06යි.)
   (iv) "ත්‍රිලක්ෂණය විශ්ව සාධාරණය." විමසන්න. (ලකුණු 08යි.)

3. (i) සතර පාරාජිකා නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) 'පාතිමොක්ඛ' යන්න හඳුන්වන්න. (ලකුණු 04යි.)
   (iii) විනය ශික්ෂාපද පැණවීමට බුදුන් හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)
   (iv) ආචාර්යවරයාගේ හා උපාධ්‍යායවරයාගේ වගකීම් අගයන්න. (ලකුණු 08යි.)

## II කොටස

4. (i) සත්තපදාර්ථ වාදය යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 08යි.)
   (ii) එම වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය පෙන්වා දෙන්න. (ලකුණු 12යි.)

5. (i) "සැකෙවින් කියතොත් පඤ්ච උපාදානස්කන්ධය ම දුක ය." පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)
   (ii) සංස්ථාගත දුක ගොඩනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 12යි.)

6. (i) 'යෙ ධම්මා හෙතුප්පභවා' යන්න විවරණය කරන්න. (ලකුණු 08යි.)
   (ii) සමාජ ගැටලු විග්‍රහ කිරීමෙහි ලා ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායෙන් ලැබෙන පිටිවහල අගයන්න. (ලකුණු 12යි.)

7. (i) සදාචාරය හා සාමය බිඳවැටීමට, ආර්ථිකයේ පිරිහීම හේතුවන බව බුදුදහම අනුව පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)
   (ii) එම සමාජ අර්බුදයට පිළියම් යෙදීම පිණිස උපයෝගී කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 12යි.)

8. (i) සතර කමටහන් හඳුන්වා දෙන්න. (ලකුණු 08යි.)
   (ii) චිත්ත සමාධිය තුළින් ලැබිය හැකි ලෞකික අභිඥා පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 12යි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න